# ස්ත්‍රී පුරුෂභාවය හා අධ්‍යාපන සුදුසුකම් අනුව ශ්‍රම වෙළඳපොළ සහභාගීත්වය




**මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව**

**ආර්.එම්.ජේ.එච්.ගජනායක**

**සංවර්ධන නිලධාරී**

**ස්ත්‍රී - පුරුෂභාවය හා අධ්‍යාපන සුදුසුකම් අනුව ශ්‍රම වෙළඳපොළ සහභාගීත්වය**

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ සහභාගීත්වය ගත්විට, ස්ත්‍රී/ පුරුෂභාවය අනුව පවතින විශාල පරතරය ආර්ථික වශයෙන් බරපතල ගැටළුවක් බවට පත්ව ඇත. විශේෂයෙන් ම බොහෝමයක් කාන්තාවන් අධ්‍යාපනයේ ඉහළම සුදුසුකම් ලබා ගත්ත ද එයින් රැකියාවක නිරත වන කාන්තා ප්‍රමාණය ඉතා සුළු ප්‍රතිශතයකි. වර්තමානයේ සංවර්ධනය හමුවේ කාන්තාවගේ භූමිකාව වෙනස්වෙමින් පවතී. කාන්තාව සාම්ප්‍රදායික රැකියාවලින් මිදී ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාදෙන විවිධ රැකියාවල යෙදෙන අයුරු වර්තමානයේ දැකගත හැකිය. නමුත් සමස්ථයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ කාන්තා ශ්‍රම සහභාගීත්වය තව දුරටත් පහළ මට්ටමක පැවතීම ජාතික වශයෙන් ගැටළුවකි.

01. සේවා නියුක්තිය - 2018

| රැකියා සංඛ්‍යාලේඛණ | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| සේවා නියුක්ත ජනගහනය | 8,015,166 | 5,300,310 | 2,714,855 |
| ශ්‍රම බලකාය | 8,387,759 | 5,464,236 | 2,923,523 |
| සේවා නියුක්ති අනුපාතය | 95.6 | 97.0 | 92.9 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ඉහත දත්ත දෙස බලන විට පැහැදිළිව දක්නට ලැබෙන්නේ සමස්ථයක් ලෙස ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ කාන්තා සහභාගීත්වය පහළ මට්ටමක පවතින බවයි.

02. ශ්‍රම වෙළඳපොළ සහභාගීත්ව අනුපාතය

| වර්ෂය | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| **2014** | 53.2 | 74.6 | 34.6 |
| **2015** | 53.8 | 74.7 | 35.9 |
| **2016** | 54.1 | 75.1 | 36.0 |
| **2017** | 54.1 | 74.5 | 36.6 |
| **2018** | 51.8 | 73.0 | 33.6 |
| **2019 Q2** | 52.6 | 73.4 | 34.6 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව, Lmi Bulletin – Department of Manpower and Employment

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ සහභාගීත්වය සමස්ථයක් ලෙස ගත්විට පුරුෂ පාර්ශ්වයට සාපේක්ෂව පහළ මට්ටමක පවතින බව දක්නට ලැබේ. නමුත් ඉහත දත්ත අනුව කාන්තාවන්ගෙන් තුනෙන් එකක් පමණ ජාතික දළ දේශිය නිෂ්පාදිතයට කුමන හෝ ආකාරයකින් සක්‍රීය ලෙස දායක වන බව පෙනේ. (Lmi Bulletin -2019 – Department of Manpower and Employment )

ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2017 වර්ෂයේ 36.6%ක් වුවද, 2018 වර්ෂයේ දී එය 33.6%ක් ලෙස අඩු වී ඇත. ශ්‍රී ලංකා මහබැංකු වාර්තාව දක්වන ආකාරයට එමගින් ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ සහභාගීත්ව පරතරය තව දුරටත් පුළුල් වී ඇත.

03. ආර්ථික වශයෙන් දක්වන දායකත්වය - 2018

| ස්ත්‍රී පුරුෂභාවය | ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනය | | ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන ජනගහනය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| එකතුව | 8,387,759 | 100.0 | 7,808,473 | 100.0 |
| පුරුෂ | 5,464,236 | 65.1 | 2,024,084 | 25.9 |
| ස්ත්‍රී | 2,923,523 | 34.9 | 5,784,390 | 74.1 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනය ගත්විට පුරුෂ පාර්ශ්වය කාන්තා පාර්ශ්වයට වඩා ඉහළ මට්ටමක දක්නට ලැබේ. ඊට සාපේක්ෂව ම ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන කාන්තා පාර්ශ්වය ඉහළ මට්ටමක ඇත.

04. අංශ අනුව සේවා නියුක්තිය - 2017

| අංශය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| නාගරික | 66.3 | 33.7 | 100.0 |
| ග්‍රාමීය | 63.4 | 36.6 | 100.0 |
| වතු | 54.9 | 45.1 | 100.0 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

අංශ අනුව රැකියා නියුක්තිය ගත්විට සෑම අංශයකම පුරුෂ පාර්ශ්වයට සාපේක්ෂව කාන්තා සහභාගීත්වය පහළ මට්ටමක දක්නට ලැබේ. විශේෂයෙන් ම නාගරික අංශයේ දී  පුරුෂ පාර්ශ්වයට වඩා කාන්තා පාර්ශ්වයේ සහභාගීත්වය පහළ මට්ටමක දක්නට ලැබේ.

05. රැකියා තත්වය අනුව සේවා නියුක්තිය - 2017-2018

| රැකියා තත්වය | 2017 (%) | | 2018 (%) | |
|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| මුළු එකතුව | 64.3 | 35.7 | 66.1 | 33.9 |
| සේවක | 65.5 | 34.5 | 66.1 | 33.9 |
| සේවා යෝජක | 87.3 | 12.7 | 88.0 | 12.0 |
| තමාගේම වැඩකටයුතුවල නිරත වන්නන් | 70.9 | 29.1 | 73.9 | 26.1 |
| ගෙවීමක් නොලද පවුලේ සේවකයන් | 21.1 | 78.9 | 22.9 | 77.1 |

මූලාශ්‍රය :ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ඉහත දත්ත දෙස බැලීමේ දි දක්නට ලැබෙන්නේ **ගෙවීමක් නොලද පවුලේ** වැඩකටයුතුවල **නිරතවන** කාන්තා පාර්ශ්වය ඉහළ මට්ටමක පවතී.

06. රැකියා තත්වය අනුව සේවා නියුක්තිය - 2018

| සේවා තත්ත්වය | එකතුව | | ස්ත්‍රී/පුරුෂභාවය | | | |
|---|---|---|---|---|---|---|
| | | | පුරුෂ | | ස්ත්‍රී | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| මුළු එකතුව | 8,015,166 | 100 | 5,300,310 | 100 | 2,714,855 | 100 |
| සේවක | 4,633,022 | 57.8 | 3,063,466 | 57.8 | 1,569,556 | 57.8 |
| රාජ්‍ය | 1,158,474 | 14.5 | 634,146 | 12.0 | 524,328 | 19.3 |
| පෞද්ගලික | 3,474,548 | 43.3 | 2,429,320 | 45.8 | 1,045,228 | 38.5 |
| සේවා යෝජක | 221,194 | 2.8 | 194,637 | 3.7 | 26,557 | 1.0 |
| තමාගේම වැඩකටයුතුවල නිරත වන්නන් | 2,586,135 | 32.3 | 1,910,609 | 36.0 | 675,527 | 24.9 |
| ගෙවීමක් නොලද පවුලේ සේවකයන් | 574,814 | 7.2 | 131,598 | 2.5 | 443,216 | 16.3 |

ඉහත දත්තවලට අනුව රාජ්‍ය අංශයේ කාන්තා පාර්ශ්වය වැඩි දායකත්වයක් දක්නට ලැබේ. එය 19.3%ක් වන අතර, පුරුෂ පාර්ශ්වය 12.0%ක් ලෙස දක්නට ලැබේ. පෞද්ගලික අංශයේ පුරුෂ පාර්ශ්වය වැඩි දායකත්වයක් දක්නට ලැබේ.

07. ශ්‍රම වෙළඳපොළ සහභාගීත්වය ( ස්ත්‍රී පුරුෂභාවය හා අධ්‍යාපන සුදුසුකම් අනුව)

| සේවා නියුක්තිය | 2017 | |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | පුරුෂ | ස්ත්‍රී |
| 5 ශ්‍රේණිය සහ ඊට පහළ | 70.6 | 31.4 |
| 6-10 ශ්‍රේණිය | 76.9 | 32.9 |
| අ.පො.ස (සා/පෙළ) | 67.1 | 30.8 |
| අ.පො.ස (උ/පෙළ) | 79.2 | 49.9 |
| උපාධි සහ ඊට ඉහළ | 86.8 | 82.5 |

මූලාශ්‍රය :ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ඉහත දත්ත දෙස බැලීමේදී දක්නට ලැබෙන්නේ ශ්‍රම වෙළඳපොළ බොහෝ ප්‍රමාණයක් ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පිරිසක් බවයි.

08. සේවා වියුක්ති අනුපාතය

| වර්ෂය | 2017 | 2018 | 2019 Q3 |
|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 4.2 | 4.4 | 5.1 |
| පුරුෂ | 2.9 | 3 | 3.3 |
| ස්ත්‍රී | 6.5 | 7.1 | 8.5 |

මූලාශ්‍රය :ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

09. සේවා වියුක්ති අනුපාතය (අධ්‍යාපන සුදුසුකම් අනුව) - 2018

| 2018 | | | |
|---|---|---|---|
| **සේවා වියුක්ති අනුපාතය** | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
| **මුළු එකතුව** | 4.4 | 3.0 | 7.1 |
| **10 ශ්‍රේණිය සහ ඊට පහළ** | 2.4 | 2.2 | 3.1 |
| **අ.පො.ස (සා/පෙළ)** | 5.2 | 3.9 | 8.0 |
| **අ.පො.ස (උ/පෙළ) සහ ඉහළ** | 9.1 | 5.1 | 13.2 |

මූලාශ්‍රය :ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ඉහත වගුවට අනුව, අධ්‍යාපන මට්ටම ඉහළම විරැකියා අනුපාතය අ.පො.ස (උ/පෙළ) සහ ඉහළ සමූහයෙන් වාර්තා වේ. එය පිළිවෙලින් පිරිමි හා ගැහැණු සඳහා පිළිවෙලින් 5.1% සහ 13.2% වේ. එහිදී දක්නට ලැබෙන්නේ ඉහළම අධ්‍යාපන සුදුසුකම් පැවතිය ද කාන්තා පාර්ශවය ශ්‍රම බලකායට දක්වන දායකත්වය පහළ මට්ටමක පවතින බවයි.

10. වෘත්තීය කාණ්ඩ අනුව සේවා නියුක්තිය (ස්ත්‍රී/ පුරුෂභාවය අනුව ) – 2017

| වෘත්තීය කාණ්ඩය | මුළු එකතුව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| කළමණාකරුවන් | 6.8 | 7.7 | 5.3 |
| වෘත්තිකයින් | 6.8 | 4.0 | 11.8 |
| ආශ්‍රිත වෘත්තිකයින් | 6.8 | 6.7 | 6.8 |
| සේවා සහ විකුණුම් සේවකයන් | 4.0 | 2.9 | 5.9 |
| ලිපිකරු සහාය සේවකයින් | 10.0 | 10.5 | 9.2 |
| පුහුණු කෘෂිකාර්මික, වන විද්‍යා සහ ධීවර | 17.1 | 16.9 | 17.5 |
| ශිල්පීය සහ ආශ්‍රිත කර්මාන්ත සේවකයින් | 16.7 | 17.0 | 16.0 |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ එකළස්කරුවන් | 9.0 | 12.0 | 3.7 |
| ප්‍රාථමික රැකියාවන් | 22.4 | 21.7 | 23.7 |
| සන්නද්ධ හමුදා වෘත්තීන් | 0.4 | 0.6 | 0.1 |
| එකතුව | 100.0 | 100.0 | 100.0 |

මූලාශ්‍රය :ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

ප්‍රධාන වෘත්තීය කාණ්ඩ අනුව ගත්විට වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික රැකියාවල නිරතවන අතර, ඉන් කාන්තා පාර්ශවය වැඩි අගයක් ගනි. 'වෘත්තීය' කාණ්ඩය ගත්විට පුරුෂ පාර්ශවයට වඩා ඉහළ ප්‍රවණතාවයක් කාන්තා පාර්ශවයේ දක්නට ලැබේ. 'පුහුණු, කෘෂිකාර්මික, වනවිද්‍යා හා ධීවර , ශිල්පීය සහ ආශ්‍රිත කර්මාන්ත සේවකයින්' යන වෘත්තීය කාණ්ඩ දෙකෙහි ද කාන්තා පාර්ශවයේ වැඩි සහභාගීත්වයක් දක්නට ලැබේ.

සමස්ථයක් ලෙස ගත්විට ශ්‍රම වෙළඳපොළ කාන්තා පාර්ශ්වයේ සහභාගීත්වය පහළ මට්ටමක පවතින බව දක්නට ලැබේ. ඒ සඳහා ප්‍රතිපත්ති සකස් කරමින් කාන්තාවන් ශ්‍රම වෙළඳපොළ සඳහා ආකර්ශණය කර ගැනීම සඳහා කටයුතු කිරීම වැදගත් වනු ඇත.